## 445 බෙත්ලෙහෙම් පුරයේ

බෙත්ලෙහෙම් පුරයේ සීතල රෑ යාමේ හිම කඳු හෙල් අතරේ
කඳු හෙල් අතරේ එඬේරු මතිනේ සුරදූතුවන් එන්නේ
සුරදූතු එන්නේ අහස දිලෙන්නේ එඬේරු කැළැඹෙන්නේ
සාමයේ ගීතේ // පිළි රැව්දේ

සුමඟුල් පුවතක් අප ගෙනැ එන්නේ
පුත් දෙව්ඳුන් අද ඉපැදී ඉන්නේ
මහොතුම් දෙව්ඳුන් මහිමය ඔබවේ
දෙව් හද දිනුවෝ සාමෙ සදන්නෝ

නොබියවැ අසන්න සත හට මංගල සුපුවත දන්වන්නා
කිරි කැටි කිතිඳුයි සන්හිඳියාවේ දිව්පුර උපදින්නා
හානකඩින් එතු දෙව් පුතු ගව ඕරුවේ දැන් සැත පෙන්නා
ගොසින් බලා වැඳ // සාමෙ ලොවට කියව්

සුපුවත පවසා සුරදූතු ලස්සන පැසසුම් ගී ගැයුවා
කඳු හෙල් අතරේ ඒ අනුසාරෙන් එඬේරු ගී ගැයුවා
යමු යමු අපි දැන් බෙත්ලෙහෙමට යමු දෙව්දූතු වදින ලෙසා
සාමයේ ගීතේ // පිළි රැව් දේ

දෙව්ඳුන් දිළිඳුව ගව ඕරුවේ ඇත සැතපී සැතැහීලා
මරිමව් ජොසපුත් සමගින් ඔකඳින දරු සෙනෙහසැ වෙලිලා
එඬේරු ඇසූ දුටු හැමදේ පවසා හැමෝම මවිත කළා
සාමයෙ ගීතේ // පිළි රැව් දේ